රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 08/96

මගේ අංකය :-III/0266/2/68/එල්/එච්ජ්-8
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996.03.15 වන දින

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ආපද ණය සහ වෙතන් ණය**
**<u>ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයට සංශෝධන</u>**

ආයතන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදයේ 10:4 උප වගන්තිය ඉවත් කර, කරුණාකර ඒ වෙනුවට පහත උප වගන්ති ආදේශ කරන්න.

**10:4 ඇපකරුවෝ ,**

සේවා කාලය අවු. 10 ට අඩු ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි නිලධාරීන් සම්බන්ධයෙන්, අවු. 10 ට නොඅඩු සේවා කාලයක් ඇති ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි එක් ඇපකරුවෙකු හෝ අවු. 5 ට නොඅඩු සේවා කාලයක් ඇති ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි ඇපකරුවන් දෙදෙනෙකු හෝ ඉදිරිපත් කළ යුතුය. අවු. 10 ට වැඩි සේවා කාලයක් ඇති ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි නිලධාරීන් සඳහා ඇපකරුවන් අවශ්‍ය නොවේ.

**10:4:1**

ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීමේදී, යම් අවස්ථාවක ප්‍රධාන ණයකරු විසින් නොගෙවා ඇති ණය මුදල හා ඒ සඳහා වන පොලියද සමභාග වශයෙන් ගෙවීමට ඇපකරුවන් දෙදෙනා විසින් වෙන වෙනම බැඳී සිටින ලෙසට බැඳුම්කරයකට අත්සන් කළ යුතුය. ඒ සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/95 හි සඳහන් පොදු ආකෘති පත්‍ර 158(අ) යොද ගැනීම මැනවි.

02. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිවය.

අ.කලේ(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය